# සුප්පාවාසා සූත්‍රය

(උදානපාළි, ඛු.නි. i, 158-164 පිටු)

එක් කලෙක භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ කුණ්ඩියා නම් නගර සමීපයෙහි කුණ්ඩධාන නම් වනයෙහි වැඩ වාසය කළහ. එකල්හි සුප්පවාසා නම් කෝලිය රාජ දියණිය සත්වස් සත් දිනක් ගැබ්බර ව සිටියේ සත් දිනක් මුළුල්ලෙහි මූඪගර්භ ව සිටියා ය. මෙකල ඇය තියුණු වූ කර්කශ වූ කටුක වේදනාවෙන් යුතුව කල් ගත කළ අතර එම වේදනාව ඉවසා සිටියේ බුදුරදුන්, සංඝයා හා නිවන පිළිබඳ කුසල සිතිවිලි (විතර්ක) මෙනෙහි කරමිනි. මෙහි දී ඇය **'මෙබඳු දුක් දුරු කරලනු පිණිස ධර්මය දේශනා කළ බුදුරජාණන් වහන්සේ සම්මා සම්බුද්ධ ය. මෙබඳු දුක් දුරු කරලනු පිණිස පිළිපන් ඒ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා සුපටිපන්න ය. යම්බඳු වූ නිවනෙක මෙබඳු දුකක් නොමැත්තේ ද ඒ නිවන ඒකාන්තයෙන් උතුම් ම සුවයෙකි'** යනු ඇය තම දුක් වේදනා යටපත් කළ ත්‍රිවිධ විතර්කයන් ය.

මේ අතර සුප්පවාසා කුමරිය තම ස්වාමියා අමතා **'බුදුරදුන් වෙත ගොස් උන් වහන්සේ බැහැදක උන් වහන්සේගේ සුවදුක් විමසා තම කායික වේදනාව උන්වහන්සේට පවසා සිටින ලෙස'** පැවැසුවා ය. ඒ අනුව කෝලිය පුත්‍රයා බුදුරදුන් වෙත ගොස් තම බිරිඳ පසුවන තත්ත්වය පිළිබඳව බුදුරජාණන් වහන්සේට දන්වීය. මෙහි දී බුදුරජාණන් වහන්සේ,

**'සුප්පවාසා කෝලිය දියණිය සුවපත් වේවා, නීරෝගී වේවා, නීරෝගී පුතකු වදාවා යැ'**යි *(සුඛිනී හෝතු සුප්පවාසා කෝලිය ධීතා අරෝගා, අරෝගං පුත්තං විජායාතූ'ති)* ආශීර්වාද කළහ.

බුදුරදුන්ගේ මෙම ආශීර්වාදයත් සමඟ ම සුප්පවාසා කෝලිය දියණිය නිදුකින් නිරෝගී පුතකු ජනිත කළා ය. කෝලිය පුත්‍රයා යළි නිවස වෙත පැමිණෙන විට තම බිරිඳ නීරෝගී පුතකු ජනිත කොට ගැබ්බරින් මිදී සුවසේ සිටිනු දැක බුදුරදුන්ගේ මහත් ආනුභාවය පිළිබඳ බෙහෙවින් ප්‍රසාදයට හා සතුටට පත් විය. පසුව **'සීවලී'** නමින් ප්‍රකට වූයේ මෙම පින්වත් කුමරුවායි. සත් අවුරුදු සත්දිනක් තිස්සේ විඳි මහත් දුකින් නිදහස් වූ සුප්පාවාසා තෙරුවන පිළිබඳ බලවත් ප්‍රසාදයෙන් සත්දිනක් මුළුල්ලෙහි බුද්ධප්‍රමුඛ මහාසංඝයාට දන් දෙනු රිසියෙන් ඒ බව තම ස්වාමියාට දන්වා බුදුරදුන්ට දානයට ආරාධනා කරන ලෙස පවසා සිටියා ය.

නැවත බුදුරදුන් වෙත ගිය කෝලිය පුත්‍රයා තම බිරිඳගේ සුවපත්භාවය පවසා අනතුරුව තම නිවසෙහි දනට වඩින ලෙස බුදුරදුන්ට ඇරැයුම් කළේ ය. මේ වන විට සංඝයා වහන්සේ වෙනත් දායකයකුගේ දානයට ආරාධනා ලැබ සිටියහ. ඒ පිළිබඳව සොයා බැලීමේදී බුදුරදුන්ට පෙනී ගියේ එලෙස දානයට ආරාධනා කර සිටියේ මුගලන් මාහිමියන්ගේ සමීප දායකයකු විසින් බවයි. බුදුරජාණන් වහන්සේ මුගලන් මාහිමියන් කැඳවා සුප්පවාසාවගේ දානය පිළිබඳව කරුණු දක්වා කලින් කළ ආරාධනාව පසුවට යොදාගත් ගන්නා ලෙස එම දායකයාට දන්වා සිටින ලෙස පැවැසූහ. 'ස්වාමීනි, එසේ යැ'යි පිළිතුරු දුන් මුගලන් මාහිමියන් වහන්සේ එම දායකයාගේ නිවෙසට ගොස් සුප්පාවාසාවගේ දානය පිළිබඳව කරුණු දක්වා දානය සත්දිනකින් පසුව දෙන ලෙස දායකයාට දන්වා සිටියහ. මෙහිදී එම දායකතුමා **'ස්වාමීනි, මාගේ වස්තුව, ජීවිතය, ශ්‍රද්ධාව යන කරුණු තුන පිළිබඳ ව ඔබ වහන්සේ ඇප වන්නේ නම් මම මගේ දානය පසුවට කල්දමා ගැනීමට කැමැති වෙමි'**යි පැවැසීය. මුගලන් මාහිමියන් වහන්සේ පවසා සිටින්නේ **'ඇවැත්නි, මම ඔබගේ වස්තුව හා ජීවිතය පිළිබඳව ඇප වෙමි, නමුත් මට ඔබගේ ශ්‍රද්ධාව පිළිබඳව ඇප විය නොහැක, ඒ ගැන ඔබ ඔබට ම ඇප වන්න'** කියායි. දායකතුමා එවිට පැවැසුවේ **'ස්වාමීනි, මුල් කරුණු දෙක පිළිබඳ ඔබ වහන්සේ ඇප වන්නේ නම් ශ්‍රද්ධාව පිළිබඳ ව මම ඇප වෙමි, සුප්පවාසාවගේ දානය මුලින් පිළිගන්න, මගේ දානය සත්දිනකින් පසුව පිළිගන්වමි'** කියායි.

මෙලෙස උපාසකතුමා දනුවත් කොට මුලින් භාරගත් දානය පසුවට කල්දමා බුදුරදුන් වෙත නැවත පැමිණි මුගලන් මාහිමියන් වහන්සේ ඒ බව භාග්‍යවතුන් වහන්සේට දන්වා සිටියහ. ඒ අනුව සුප්පවාසාවගේ දානයට යාමට තීරණය විය. බුදුරජාණන් වහන්සේ අග්‍රශ්‍රාවකයන් වහන්සේලා ඇතුළු මහාසංඝයා සමඟ සුප්පවාසාවගේ නිවසෙහි දානයට වැඩම කළහ. මෙලෙස එම නිවසෙහි සත් දිනක් මුළුල්ලෙහි ප්‍රණීත

ආහාර පාන සහිත ව දානය පැවැත්විණ. බුද්ධප්‍රමුඛ භික්ෂු සංඝයා වහන්සේ ද ඊට සහභාගී වූහ. සැදැහැවත් සුප්පවාසා කුමරිය බලවත් ප්‍රසාදයෙන් යුතු ව තම සිඟිති පුතණුවන් ලවා ස්වාමීන් වහන්සේලාට වැන්දවූවා ය.

සත්දින අවසානයෙහි සැරියුත් මාහිමියන් වහන්සේ **'දරුව, කිම නුඹට සනීප කෙසේ ද, දුකක් නැත් ද යැ'**යි කුඩා සීවලී කුමරුගෙන් විචාළහ. එවිට කුඩා දරුවා පැවැසූයේ **'ස්වාමීනි, මට කවර සැපයක් ද සත් වසක් මම ලේ සැළියක වාසය කළෙමි'** යනුවෙනි. ධර්මසේනාධිපති සැරියුත් මාහිමියන් සමග තම සිඟිති පුතු කථා කරනු දුටු සුප්පවාසා කුමරිය බලවත් ප්‍රමෝදයෙන් යුතු ව සොම්නසට පත් වූවාය. මෙලෙස බලවත් ප්‍රමෝදයෙන් පසුවන සුප්පවාසාව දුටු භාග්‍යවතුන් වහන්සේ ඇයට ගැඹුරු ධර්මාවවාදයක් දෙන අදහසින් **'සුප්පවාසාවෙනි, නුඹ මෙබඳු තවත් පුතකු ලැබීමට කැමැත්තෙහි ද'**යි විචාළහ. එවිට සුප්පවාසාවගේ අදහස වූයේ **'ස්වාමීනි, මම මෙබඳු පුතුන් සත් දෙනෙකු වුව ද ලැබීමට කැමැත්තෙමි'** කියායි.

බුදුරජාණන් වහන්සේ වහන්සේ මේ අවස්ථාවෙහි සුප්පවාසාවගේ ප්‍රඥාව දියුණු කරලීම සඳහා ඇයට ගාථාවකින් අනුශාසනා කළහ.

> *'අසාතං සාතරූපෙන පියරූපෙන අප්පියං,*
> *දුක්ඛං සුඛස්ස රූපෙන පමත්තමතිවත්තතී'ති.'*
> (අමිහිරි දෙය මිහිරි වශයෙනුත් අප්‍රිය දෙය ප්‍රිය වශයෙනුත් දුක
> සැප වශයෙනුත් ප්‍රමාදී පුද්ගලයා ඉක්මවා යේ.)

අනුසෝතගාමී හෙවත් ලෝකය ගලාගෙන යන දෙසට එනම් පහළට ගලාගෙන යන අදහස් ඇති ලෝක සත්ත්වයා අමිහිරි දෙය පිළිබඳව කල්පනා කරන්නේ මිහිරි ලෙසිනි. අප්‍රිය දෙය සලකන්නේ ප්‍රිය වශයෙනි. දුක සලකන්නේ සැප වශයෙනි. බුදුදහම යනු පටිසෝතගාමී වූවකි. එනම් උඩුගං බලායන්නකි. එනම් ලෝකයා සිතනවාට වඩා වෙනස් අයුරින් ගැඹුරින් හා ප්‍රඥාවෙන් ලෝකය දෙස බලන දහමකි. ලෝකය යනු රූප, වේදනා, සංඥා, සංස්කාර, විඥාන යන ස්කන්ධ පහේ එකතුවයි. ලොව පවත්නා ඕනෑ ම දෙයක් මේ පහට ඇතුළත් කළ හැක. මින් අන්‍ය වූ කිසිවක් ලොව නැත. මේ පහ නිත්‍ය, සැප, ආත්ම, සුභ, ආස්වාද වශයෙන් සැලකීම ලෝක සත්ත්වයාගේ ස්වභාවයයි. බුදුදහම මේ පහෙන් සැදි ලෝකය දකින්නේ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම, අසුභ වූවක් වශයෙනි. මේ කිසිදු දෙයක් සාරයක් නැත. යමෙක් මෙම රූපාදි ස්කන්ධ පහ දැඩිව ආශාවෙන් අල්වා ගත්තේ ද ඔහු සැබැවින් ම අල්වා ගත්තේ දුකයි. යමෙක් මේ පහ අත් හැරියේ නම් සැබැවින් ම ඔහු අත් හැරියේ දුකයි.

අවිද්‍යාවෙන් වෙළී සිටින තෘෂ්ණාවෙන් බැඳී සිටින ලෝක සත්ත්වයාට මෙහි යථා ස්වභාවය පිළිබඳව පැහැදිලි කර දීම දුෂ්කර වූවකි. බුදුරජාණන් වහන්සේ ලොවට ධර්මදේශනා කිරීමට ප්‍රථම මේ පිළිබඳව කල්පනා කොට සත්ත්වයන් ධර්මාවබෝධ කරවීමේ දුෂ්කරත්වය ගැන සිතා බැලූහ. එහෙත් ඒ අතර සිටින ප්‍රඥාවන්ත කෙලෙස් අඩු පුද්ගලයන් ගැන සිතා ධර්මදේශනා කිරීමෙහි උත්සාහවත් වූහ.

සමස්ත බුදුදහම ම දේශනා කර ඇත්තේ ලෝකයාට නිවැරදි දැක්මක් හෙවත් සම්‍යග් දර්ශනයක් ලබාදීම සඳහායි. එහිලා ලොව පවත්නා යථාර්ථය වන දුකත් එම දුකින් නිදහස් වීමත් පැහැදිලි කරදීම බුදුදහමේ මූලික ඉලක්කයයි. චතුරාර්ය සත්‍යය දේශනා කළේ මේ ඉලක්කය සපුරා ගැනීම සඳහායි.

සසර පුරන ලද පාරමිතා ඇති මහත් පුණ්‍ය මහිමයක් සහිත ව උපන් සීවලී කුමරු පසුකාලීනව පැවිදි ව ගෞතම සම්බුදු සසුනෙහි ප්‍රත්‍යලාභීන් අතර අගතැන්පත් විය. අන්‍ය භික්ෂූන්ට ද සම්බුදු සසුනට ද උන් වහන්සේ ඉතා වටිනා මෙහෙයක් සිදු කළ අතර උන් වහන්සේගේ ගුණ මහිමය අද පවා ලෝකයා මහත් බැතිසිතින් සමරති.